# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment


මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/02/16
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2022.12.23

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි ප්‍රජාමූල බැංකු විෂය කළමනාකරුවන්
සියළුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරුවන්

## <u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු ලිපිද්‍රව්‍ය චක්‍රිය අරමුදල</u>

සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති සඳහා ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කර බෙදා හැරීමේ කටයුතු කරනු ලබන්නේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ ලිපි ද්‍රව්‍ය චක්‍රිය අරමුදල මගින්ය.

ලිපි ද්‍රව්‍ය මුද්‍රණ හා ප්‍රවාහන වියදම් ඇතුළු මුද්‍රණ මෙහෙයුම් වියදම් ඉහළ යාම මෙන්ම ලිපි ද්‍රව්‍ය චක්‍රිය අරමුදලට සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති මගින් අය විය යුතු මුදල් නිසි පරිදි නොපිය වීම හමුවේ චක්‍රිය අරමුදල ඵලදායි ලෙස කළමනාකරණය කිරීම දුෂ්කර වී ඇත.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති මගින් ඇණවුම් සඳහා මුදල් පියවීම ප්‍රමාද වීම හේතු කොටගෙන ලිපි ද්‍රව්‍ය මුද්‍රණ ආයතන වෙත ගෙවිය යුතු බිල්පත් නිසි කලට ගෙවීමට නොහැකි වී ඇත. මෙම තත්ත්වය ලිපි ද්‍රව්‍ය සැපයුම් ප්‍රමාද වීමට හේතු වේ.

ලිපි ද්‍රව්‍ය චක්‍රිය අරමුදල වඩාත් ඵලදායි හා කාර්යක්ෂම ලෙස පවත්වා ගෙන යාම සඳහා ලිපි ද්‍රව්‍ය චක්‍රිය අරමුදලට ලැබිය යුතු මුදල් දිස්ත්‍රික් හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති මට්ටමින් කඩිනමින් ගෙන්වා ගැනීමටත්, මුද්‍රණ හා මුද්‍රණ මෙහෙයුම් වියදම් ඉහල යාම හේතුවෙන් අරමුදලට වන බලපෑම අවම කිරීම සඳහාත් 2022.11.30 දින රැස් වූ බැංකු කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් තීරණ ගෙන ඇත. එම තීරණය 2023 ජනවාරි 01 වෙනි දින සිට ක්‍රියාත්මක කෙරේ.

1. ලිපි ද්‍රව්‍ය නිකුත් කිරීම සඳහා වන ගැලපුම් ගාස්තුව 2.5% ඉහල දැමීම.
2. බිල්පත් පියවීම මසක කාලයක් ඉකුත් වන්නේ නම් ගතවන සෑම සතියක් සඳහාම 2% ප්‍රමාද ගාස්තුවක් අය කිරීම.
3. මෙම ප්‍රමාද ගාස්තුව ගෙවීමේ වගකීම බිල්පත් පියවීම ප්‍රමාද කළ සමෘද්ධි බැංකුව/ සමිතිය මගින් දැරීම.

ඉහත ප්‍රමාදයන් හා චෙක්පත් වල අඩුපාඩු අවම කර ගැනීම සඳහා අදාළ ප්‍රජාමූල බැංකු හා සමිති මගින් නිකුත් කරනු ලබන චෙක්පත් ලංකා බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ ගිණුම් අංක 0002937993 තැන්පත් කර, එහි පිටපත (Cheque deposit slip) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමෘද්ධි අංශයට ලබා දිය යුතුය. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ඉන්වොයිසියේ සඳහන් සම්පූර්ණ මුදලේ වටිනාකමට සමාන චෙක් තැන්පත්වල (Cheque deposit slip) පිටපත් ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

මේ සඳහා ඔබෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

එස්.ජේ.එස්. වික්‍රමසිංහ
අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) රා.ඉ.
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පිටපත:-
1. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |